# මෙල්බන් වේදිකාවට නැවුම් අත්දැකීමක්

## කොහෙද යන්නෙ හොරෙක් වගේ පෙබරවාරි 26 වෙනිදා සවස 6ට



### ගයාන් කණිෂ්ක රාජපක්ෂ සමග පිළිසඳරක්

2004 වර්ෂයේ -ඇන්ටික්" නමින් අපූර්ව කෙටි නාට්‍යයක් නිර්මාණය කරමින් එවකට ශ්‍රී ලාංකික වේදිකාවේ කෙටි නාට්‍ය නිර්මාණකරුවන් අභිබවා තරුණ නිර්මාණකරුවෙක් ඔහුගේ නිර්මාණ කෞෂල්‍යය සිංහල වේදිකාව මත ප්‍රදර්ශනය කළේ ය. එම නාට්‍යය රාජ්‍ය කෙටි නාට්‍ය උළෙලේ අවසන් වටය නියෝජනය කරමින් සම්මාන සහතික ද දිනා ගත්තේ ය. ඒ සමගම 2005 වර්ෂයේ කොළඹ විශ්ව විද්‍යාලය තුළ ඔහුගේම නාට්‍ය 5ක් ඇතුළත් කෙටි නාට්‍ය උළෙලක් ඉදිරිපත් කරන්නට ඔහු සමත් විය. ඒ නාට්‍ය නම් මං වගේම එකෙක් දවස ආවා හදිසි අනතුරක්, ඇන්ටික් හුදෙකලා ස්මරණ ය. මේ හුදකලා දස්කම් දැක්වූ නාට්‍ය ශිල්පියා ගයාන් කණිෂ්ක රාජපක්ෂ යි. ඔහුගේ නිර්මාණ වල පෙනෙන්නට තිබූ විශේෂත්වය වන්නේ මෙතෙක් කල් පැවති කෙටි නාට්‍ය වල තිබූ ආකෘතියේ වෙනසක් ඇති කරමින් සිය කමාටම අනන්‍ය වූ ආකෘතියකට යන්නට වෙර දැරීමයි.

මේ නිර්මාණකරුවා මෙල්බර්න් නුවරට පැමිණ ඔහුගේ දක්ෂකම් අප සමග සිටිනා දක්ෂ ශිල්පීන් ශිල්පිණියන් සමග එක්වී ප්‍රේක්ෂකයන්ට ඉදිරිපත් කරන්නට සූදානම් වන මොහොතේ කණිෂ්ක සහ ඔහුගේ නිර්මාණ කෙරෙහි අවධානය යොමු කරන්නට අපි සිතුවෙමු.

**ඔබ නාට්‍යකරණයට යොමුවුණේ කෙසේ ද?**

## මුහුණට මුහුණ

ශ්‍රීනාත් මද්දුමගේ

මම නාට්‍යකරණයට එළඹුනේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබන අවධියේදියි. මම අධ්‍යාපනය ලැබුවේ හොරණ තක්ෂිලා වේ යි. හොරණ තක්ෂිලාව කියන්නෙත් නාට්‍ය ශිල්පීන් රැසක් රටට බිහි කළ පාසලක්. අවාසනාවකට මෙන් මට පාසල් කාලයේදී නාට්‍ය වලට යොමු වෙන්න අවස්ථාව ලැබුණේ නැහැ. නමුත් හිත ඇතුළෙ තිබුණ මෙම බලාපොරොත්තු සහ දක්ෂතා විශ්ව විද්‍යාලයේදී මුවහත් කරගන්නට මට හැකියාව ලැබුණා. තවිත හේතුවක් වුණේ මම උපාධිය සඳහා ජනමාධ්‍ය ක්ෂේත්‍රය හැදෑරීමයි.

**ඔබට මේ පාරේ යන්නට ගුරුහරුකම් දුන්න අය කව්ද?**

එහෙම සුවිශේෂී අය නම් නැහැ. නමුත් ගාමිණී හත්තොටුවේගම සිරිසේන ප්‍රේමලාල් මංගල සේනානායක යන මහත්වරුන් මම ආදරයෙන් සිහිපත්ක කරනවා. ඔවුන්ගේ ඇසුර මගේ නිර්මාණ වලට විශාල පිටුවහලක් වුණා.

**ඔබ රූපවාහිනී ක්ෂෙත්‍රයටත් සම්බන්ධව සිටියා නේද?**

ඔව්. මම 2005 වසේර් ජාතික රූපවාහිණියේ සහය අධ්‍යක්ෂවරයකු ලෙස වැඩ කළා. ඒ අතරේ රූපවාහිණියේ නාට්‍ය ශිල්පීන් වන මොහාන් ජී රංගනාත්, සන්තුෂ ලියනගේ වැනි අධ්‍යක්ෂවරුන්ගේ නිර්මාණ වල සහය අධ්‍යක්ෂවරයකු ලෙස වුඩ කළා. 2006 වසරේ මගේ ඇසින් මම නමින් රූපවාහිණී නාට්‍යයක් නිර්මාණය කළා. ඉන් අනතුරුව මැක්ස් නාලිකාවට මම සම්බන්ධ වුණා. එහි නිෂ්පාදකවරයකු හැටියට මම නිර්මාණාත්මක වැඩ සටහන් කීපයක්ම ඉදිරිපත් කළා. මියැසි නිම්නය, හාඩ්ටෝක්, තුන් දොර යන වැඩ සටහන් තුළින් මට ප්‍රේක්ෂකයන් අතරට යන්නට අවස්ථාව ලැබුණා.

**ඔබ දීර්ඝ නාට්‍යට වඩා කෙටි නාට්‍යයට ඇලුම් කරන්නේ ඇයි?**

ඒකට විශේෂ හේතුවක් තියෙනවා. දිගු නිර්මාණයකට වඩා කෙටි නිර්මාණයක් තුළින් ප්‍රේක්ෂකයා විඩාවට පත් නොකර ඔහු කම්පනයට පත් කරන්නට කෙටි නාට්‍යයෙන් පුලුවන් කියලා මම හිතනවා. ඒ එක්කම කෙටි නාට්‍යය කියන ආකෘතිය ගැන කෙළින්ම කතා කරනවා නම් කෙටි නාට්‍ය කියන භාෂා භාවිතයත් සමගම එය කාලයත් සමග නිශ්චිත වූ ආකෘතියක් කියන එක ඉතා පැහැදිළියි. එම නිර්වචනයත් එක්කම එන සීමාසහිත කාලය ඒ ආකෘතියට ආභරණයක් ලෙයසි මම සළකන්නෙ. ප්‍රේක්ෂකයන් අතර කෙටි නාට්‍ය ජනප්‍රිය වීමට ප්‍රධාන හේතු ලෙස මා දකින්නේ ඒ කාලයයි. එම නිශ්චිත කෙටි කාලයත් සමග ලබා දෙන වටිනා-කම නිර්මාණකරුවාට අභියෝගයක්.

**ඔබ මෙම උළෙලට ඉදිරිපත් කරන්නට සැළසුම් කරන නාට්‍යවල ආකෘතිය කෙබඳුද?**

මම මේ නාට්‍ය උළෙලට නාට්‍ය 4 ක් ඉදිරිපත් කරනවා. එකක් තමයි කො-හෙද යන්නෙ හොරෙක් වගේ. මෙහි තියෙන විශේෂත්වය නම් මෙය කෙටි දිගු නාට්‍යයක් වීම. මෙයින් මම උත්සාහ කරන්නේ නීති විරෝධීව ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වීමට උත්සාහ ගත් ශ්‍රී ලාංකිකයන් කීප දෙනෙකුට රට ඇතුලට ඒමට බැරිවීම තුළ ඇතිවන පුද්ගලාන්තර සහ අන්තර්පුද්ගල ගැටුම ප්‍රේක්ෂකයන්ට ඉදිරිපත් කිරීමටයි. ඒ එක්කම සංජානා කෙටි නාට්‍යය ෆැන්ටසි නමැති සංකල්පය පාදක කොට ගනිමින් නිර්මාණය කළ එකක්. ෆැන්ටසි ආකෘතිය අනුගමනය කරමින් නිර්මාණය කළ සිනමා කෘති බොහෝ ති.බෙනවා. මේ ආකෘතිය වේදිකාව මතට ගෙන ඒමෙන් එම මායාරූපී භාවිතාව හරහා ආදරය නමැති සංකල්පය නිර්මාණය කරන්නට මම උත්සාහ කළා.

අනිත් නාට්‍යය වතුර නටනවා - මාව ගන්නකෝ යන්නයි. මේ නාට්‍යය 2007 වසරේ රාජ්‍ය කෙටි නාට්‍ය උළෙලේ හොඳම නළුවා සම්මානය ඇතුළු සම්මාන 5ක් දිනාගත් නාට්‍යයි. මේ නාට්‍යය පුද්ගල මනෝභාවය පාදක කරගත් නාට්‍යයක්. යථාර්ථය හා මනෝභාවයන් අතර ගැටුම මෙයින් නිරූපනය වෙනවා.

**මෙවැනි බාරධූර කාර්යයක් කරන්නට ඔබට තිබෙන සම්පත් මොනවාද?**

මෙල්බන් නුවරදී මා ලැබූ ලොකුම සම්පත තමයි මිනිස් සම්පත. මං එහෙම කියන්නෙ මං මේ රටට ආවට පස්සෙ බොහෝ නාට්‍ය නරඹන්නට අවස්ථාව ලැබුණා. එතෙන්දි මට දැකගන්න ලැබුණා මෙහි ඉන්න ශිල්පීන්ගේ ශිල්පිණියන්ගේ දක්ෂතාව. ඉතින් මට හිතුණා මේ අයත් එක් කර ගනිමින් මගේ නිර්මාණ ඔවුන්ගේ ශක්තිය තුළීන් ප්‍රේක්ෂකයන්ට ඉදිරිපත් කිරීමට. ඉතින් ඔවුන් මේ කාර්යයේදී මොන රාජකාරි වැඩ බහුලතාවක් තිබුණත් නාට්‍යය පුහුණුවීම් සඳහා පැමිණ හරි යමක් ඉදිරිපත් කිරීමට ඇප කැප වුණා. එයත් මා ලැබූ විශාල ජයග්‍රහණයක්. නම් වශයෙන් නොකීවත් මේ සියලු දෙනාටම ස්තුති කරන්නට මා මේ අවස්ථාව යොදා ගන්නවා.

**අවසාන වශයෙන් මෙල්බන් ප්‍රේක්ෂකයන්ට කියන්න තියෙන්නෙ මොකක්ද?**

මෙල්බන් කියන්නෙ හොඳ ශ්‍රී ලාංකික නාට්‍ය ප්‍රේක්ෂකයන් පිරිසක් ඉන්න නගරයක්. කලාවක් විදියට නාට්‍ය කලාව ඉදිරියට ගෙනයන්නට මේ ප්‍රේක්ෂක පිරිස ප්‍රධාන හේතුවක්. මේ කෙටිනාට්‍ය උළෙලින් මම බලාපොරොත්තු වෙන්නේ වේදිකා නාට්‍ය රස විඳින්නට කැමති ප්‍රේකෂකයන්ට වෙනස්ම ආකාරයට අත්දැකීමක් ලබා දෙන්නයි. එම අත්දැකීම අපූර්ව එකක් මෙන්ම වේදිකාවේ කෙටි නාට්‍ය වල ඇති ගුණාත්මක භාවය සහ එයින් ඇති කිරීමට හැකි කම්පනය ඔවුන්ට විඳින්නට අවස්ථාව සළසා දෙන්න අපි උත්සාහ කරනවා. මෙය බාල මහලු සැමටම එකසේ රස විඳිහ හැකි නිර්මාණ පෙළක් වන බව මට එඟ්කා-න්තයෙන් විශ්වාසයි. ඒ වගේම පෙබර-වාරි 26 වෙනිදා සවස 6ට කෙල්වොට්සන් රංග ශාලාවට පැමිණෙන ලෙස මම සියලු දෙනාගෙන්ම කාරුණිකව ඉල්ලා සිටිනවා. ඒ එක්කම මේ නාට්‍ය උළෙල ඉදිරිපත් කරන්නට නන් අයුරින් උපකාර වූ අනුග්‍රහය දැක් වූ රගනය ඇතුලු සියලු අංග වලින් සහය වූ සැමට අනේකවාරයක් ස්තුතියි.

කෙටි නාට්‍ය පිළිබඳව විශාල දැනුම් සම්භාරයක් ඇති රාජ්‍ය සම්මාන ලාභී මේ අපූරු ශිල්පියාගේ රංග කාර්යය දැක ඔවුන් දිරිමත් කිරීමට අපි සියලු දෙනාම එදිනට කෙල් වොට්සන් රංග ශාලාවට පිය නගමු.



